# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
“பரிசர பியச”, 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa",104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. }

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. }

දිනය / திகதி / Date } 2020.07.12

## මාධ්‍ය නිවේදනය

**ගම්පහ තිහාරයේ පවත්වාගෙන ගිය නොදිරන පොලිතින් ආහාර දවටන නිපදවන කම්හලක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් වටලනු ලබයි.....**

ගම්පහ දිස්ත්‍රික්කයේ තිහාරිය පොලිස්බල ප්‍රදේශයේ පවත්වාගෙන ගිය නොදිරන පොලිතින් ආහාර දවටන (ලංච්ශීට්) නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පසුගිය දා (2020.07.10) වටලනු ලැබීය. පාරිභෝගික කටයුතු අධිකාරිය සහ ශ්‍රී ලංකා පොලීසිය සමඟ එක්ව මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම වැටලීම සිදුකරන ලදී.

නොදිරන පොලිතින් ආහාර දවටන නිපදවන යන්ත්‍ර හතරක්, එම දවටන කපන යන්ත්‍ර හතරක්, මිශ්‍රණ යන්ත්‍රයක් සහ තවත් යන්ත්‍ර සූත්‍ර භාවිත කරමින් නොදිරන පොලිතින් ආහාර දවටන නිෂ්පාදනය කිරීමට මෙම කර්මාන්ත ශාලාව කටයුතු කර ඇති බව මෙම වැටලීමේ දී අනාවරණ විය.

වැටලීම සිදුකරන අවස්ථාවේදී නිෂ්පාදනය කරමින්තිබූ, රුපියල් ලක්ෂ හතරක පමණ වටිනාකමකින් යුත් නොදිරන පොලිතින් ආහාර දවටන කිලෝග්‍රෑම් 400කට ආසන්න ප්‍රමාණයක් පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මෙම අවස්ථාවේ දී අත්අඩංගුවට ගනු ලැබීය. අත්අඩංගුවට ගනු ලැබූ අදාළ නොදිරන පොලිතින් ආහාර දවටන තොගය අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

මෙම නිෂ්පාදන තොගය පිටකොටුවේ පිහිටි තොග අලෙවි වෙළෙඳ සංකීර්ණයකට අලෙවි කිරීමට නියමිතව තිබුණු බව පර්යේෂණවලදී අනාවරණ විය.

මධ්‍යම පරිසර අධිකාරියට ලැබුණු තොරතුරකට අනුව මෙම වැටලීම සිදුකරන ලදී.

කොවිඩ් -19 වසංගත තත්වය නිසා තාවකාලිකව නවතා තිබූ නොදිරන පොලිතින් ආහාර දවටන (ලංච්ශීට්) වැටලීම, 2020 ජුලි මස සිට නැවත ආරම්භ කිරීමත් සමඟ දිවයිනපුරා අඛණ්ඩව මෙවැනි වැටලීම් සිදුකිරීමට මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු යොදා ඇත.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0716566660, 0776252288

පී. බී. හේමන්ත ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය


| Chairman | Tel : 2872361, 2872348<br>Fax : 2872347 | Director General | Tel : 2872359<br>Fax : 2872608 | General Office | Tel : 2872278, 2873447, 2873448<br>7877277-280 | Complaint : 2888999 |
|---|---|---|---|---|---|---|
| D. D. G | HRD. Admin. & Finance<br>Tel : 2865296 Fax : 2877515 | Envt. Pollution Control<br>Tel : 2873453 Fax : 2872605 | Envt. Mgt. & Assess.<br>Tel : 2872388 Fax : 2872296 | Envt. Edu. & Awareness<br>Tel : 2872297 Fax : 2872609 | Waste Mgt.<br>Tel : 2872409 Fax : 2882152 | Regional Oper.<br>Tel : 2872370 |

පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය | சுற்றாடல் மற்றும் வனஜீவராசி வளங்கள் அமைச்சு | Ministry of Environment and Wild Life Resources